## ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:

**සියළුම අයදුම්කරුවන් අයදුම් කළ යුත්තේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි.**

01. අංක 03 (01) 2009 හා 2011.03.01 දිනැති සංශෝධිත චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

1.1 පහත සඳහන් සුදුසුකම් සපුරාලන, දැනට අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ ඇති පාසල්වල සේවයේ නියුතු ගුරුභවතුන්ට සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් සම්බන්ධව පලපුරුද්ද සහිත ගුරු උපදේශකවරුන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

(අ) ඉල්ලුම් කරන ලද විෂය උපාධියට හෝ ඩිප්ලෝමාවට හදාරා තිබීම සහ එම විෂයට අදාළව ගුරුවරයෙකු ලෙස විධිමත් පත්වීමක් ලබා තිබීම.

(ආ) අ.පො.ස. (සා/පෙළ) (10, 11 ශ්‍රේණිවලට) ගුරුවරයෙකු ලෙස ඉගැන්වීමේ කටයුතු වල නිරතවීම හෝ ගුරු උපදේශකවරයෙකු ලෙස අ.පො.ස. (සා/පෙළ) විෂය නිර්දේශවලට අදාළ රාජකාරිවල නිරතවීම.

1.2 අංක 10 සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරන ලද විෂයට අදාළ සුදුසුකම් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. එසේ සඳහන් කිරීමට අපොහොසත්වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.3 අංක 13 සහ 14 ඡේද සම්පූර්ණ කිරීමේ දී ''ඔව්'' හෝ ''නැත'' යන්න අදාළ කොටුව තුළ පැහැදිළිව සටහන් කරන්න. එසේ සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* දැනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූ අයකු නම් හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය.

1.4 ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයෙකු හෝ නේවාසිකයකු විභාගයට ඉදිරිපත් වේ නම් ඒ බව අනිවාර්යයෙන්ම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය. පවුලේ සාමාජිකයකු යනුවෙන් අදහස් කරන්නේ ඔබගේ කලත්‍රයා, ඔබගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ ඔබගේ හෝ කලත්‍රයාගේ සහෝදර සහෝදරියන් හෝ ඔවුන්ගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් වේ.

1.5 විෂයයන් දෙකකට හෝ මාධ්‍යයන් දෙකකට අයදුම් කිරීම:

අදියර දෙකකදී ඇගයීම් සිදු කිරීමට නියමිත එකම විෂයයේ මාධ්‍යය දෙකක් සඳහා හෝ පහත සංයෝජනයන් හි සඳහන් විෂයන් දෙකක් සඳහා පමණක් අයදුම් කළ හැකිය.

(21) - සිංහල භාෂාව හා සාහිත්‍යය
(47) - සිංහල සාහිත්‍ය රසාස්වාදය
(64) - දෙවන භාෂාව (සිංහල)

(22) - දෙමළ භාෂාව හා සාහිත්‍යය
(48) - දෙමළ සාහිත්‍ය රසාස්වාදය
(65) - දෙවන භාෂාව (දෙමළ)

(31) - ඉංග්‍රීසි භාෂාව
(46) - ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය

(33) - ඉතිහාසය
(61) - භූගෝල විද්‍යාව
(62) - පුරවැසි අධ්‍යාපන

(72) - අරාබි
(49) - අරබි සාහිත්‍ය රසාස්වාදය

**1.6 රජයේ පාසල් ගුරුවරුන්ගේ ඉල්ලුම් පත්‍ර මාර්ගගත ක්‍රමයට විදුහල්පති විසින් නිර්දේශ කර මාර්ගගත ක්‍රමයට හා බාගත (Download) කර ගත් දෘඪ පිටපත ද මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතුයි. සියළුම අයදුම්කරුවන් මෙම ආකෘතියේ 16 ඡේදයේ හැර ඉතිරි සියල්ල මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කර එහි PDF පිටපත බාගත කර, අංක 11 යටතේ සඳහන් කාල සටහනද සම්පූර්ණ කරන ලද දෘඪ පිටපත් දෙකක් විදුහල්පතිට/ ආයතන ප්‍රධානියාට භාර දිය යුතුය. (විෂයයන් දෙකකට හෝ මාධ්‍යය දෙකකට අයදුම් කර ඇති නම් එක් විෂයයකට/ මාධ්‍යයකට දෘඪ පිටපත් දෙක බැගින් දෘඪ පිටපත් හතරක් ඉල්ලුම් කරන විෂයය/ මාධ්‍යය විශේෂ කර දක්වා (high light) භාර දිය යුතුයි.)**

**1.7 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන පහත දක්වා ඇති ස්ථානවල පිහිටුවීමට යෝජිත ය. (ඇගයීම් කාලසීමාව දින 10 ක් පමණ වේ.)**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. කොළඹ | 10. කළුතර | 19. බණ්ඩාරවෙල | 28. තංගල්ල | 37. ත්‍රිකුණාමලය | 46. මොනරාගල | 55. කිලිනොච්චිය |
| 02. මහරගම | 11. මතුගම | 20. බදුල්ල | 29. හම්බන්තොට | 38. කෑගල්ල | 47. අම්පාර | 56. පුත්තලම |
| 03. හෝමාගම | 12. මීගමුව | 21. වැලිමඩ | 30. කුරුණෑගල | 39. පේරාදෙණිය | 48. කල්මුනේ | 57. දඹුල්ල |
| 04. පිළියන්දල | 13. ගම්පහ | 22. මහියංගනය | 31. නිකවැරටිය | 40. ගම්පොළ | 49. අක්කරෙයිපත්තු | 58. වැල්ලවාය |
| 05. මොරටුව | 14. නිට්ටඹුව | 23. අම්බලන්ගොඩ | 32. කුලියාපිටිය | 41. මහනුවර | 50. මඩකලපුව | |
| 06. හංවැල්ල | 15. රත්නපුරය | 24. ඇල්පිටිය | 33. හලාවත | 42. මාතලේ | 51. වව්නියාව | |
| 07. අවිස්සාවේල්ල | 16. පැල්මඩුල්ල | 25. ගාල්ල | 34. කැකිරාව | 43. තෙල්දෙණිය | 52. මන්නාරම | |
| 08. හොරණ | 17. ඇඹිලිපිටිය | 26. අකුරැස්ස | 35. අනුරාධපුරය | 44. නුවරඑළිය | 53. යාපනය | |
| 09. පානදුර | 18. බලංගොඩ | 27. මාතර | 36. පොළොන්නරුව | 45. හැටන් | 54. නෙල්ලිඅඩි | |

**සැ.යු. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද සඳහන් කළ යුතුය.**

1.8 පත්වීම දෙනු ලබන්නේ පෞද්ගලික හෝ රාජකාරි ලිපිනයට ආසන්නතම ඇගයීම් මධ්‍යස්ථානවලට ය. එම මධ්‍යස්ථානයේ අදාළ විෂයට ඇගයීම් මණ්ඩල නොමැති නම් හෝ ප්‍රමාණවත් පුරප්පාඩු සංඛ්‍යාවක් නොතිබේ නම් හෝ වෙනත් ආසන්න ඇගයීම් මධ්‍යස්ථානයකට යොමු කෙරේ.

02. **සහතික කරන නිලධාරියා**

ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති විසින් ද, කලාප/ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ අයදුම්පත්, කලාප/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, සහතික කළ යුතු ය.

03. **සහතික කරන නිලධාරියාට උපදෙස්**

3.1 මෙය රහස්‍ය වාර්තාවකි.

3.2 අයදුම්කරු මෙම ආකෘතියේ සඳහන් කරන ලද තොරතුරු නිවැරදිදැයි ඔබ විසින් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

3.3 ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව 3 වන පිටුවේ අදාළ ස්ථානයෙහි අනිවාර්යයෙන් ම සහතික කළ යුතුය.

3.4 ඉහත අංක 16 (a) (i) සිට (iv) දක්වා ඇති කරුණු යටතේ අයදුම්කරු පිළිබඳ ව ඔබේ තක්සේරුව අදාළ කොටුව තුළ නියමිත අක්ෂරය සටහන් කිරීමෙන් දැක්විය යුතුය.

**A - විශිෂ්ටයි    B - හොඳයි    C - සාමාන්‍යයි    W - දුර්වලයි**

3.5 සියලුම අයදුම්කරුවන් තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පතේ දෘඪ පිටපත් දෙක බැගින් සහතික කිරීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කරනු ඇත. එම ඉල්ලුම්පත්‍ර සහතික කිරීමෙන් පසු උපලේඛනගත කර අදාළ ඇමුණුම් ද සහිතව එක් පිටපතක් තම කාර්යාලයේ සුරක්ෂිතව තබාගත යුතුය. සියලුම අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර වල මුල් පිටපත ඇමුණුම් ද සහිතව, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**උත්තරපත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම්පත්‍ර අ.පො.ස. (සා/පෙළ) විභාගය** - 2024(2025)'' ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2025.02.13 බව සලකන්න.

**විභාග කොමසාරිස් ජනරාල්**
**පාසල් විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503,**
**කොළඹ.**